**ශ්‍රී ලංකා බයෝටෙක්නොලොජි ආයතනය - 2021**

**---------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 මතය**

**-----**

ශ්‍රී ලංකා බයෝටෙක්නොලොජි ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් මාස 14 සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් මාස 14 සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් මාස 14 සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**--------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 50,222,771 ක පාඩුවක් වූ අතර එය ගණනයේදි පහත දැ සැලකිල්ලට ගෙන තිබුණි.

| | |
|---|---:|
| වෙනත් මෙහෙයුම් ආදායම් | 240,000 |
| වැටුප් හා වේතන | (17,624,586) |
| සේවක අර්ථසාධක අරමුදල් දායකය | (2,098,348) |
| භාරකාර අරමුදල් දායකය | (524,587) |
| ගොඩනැගිලි කුලී | (23,676,200) |
| ක්ෂය | (313,825) |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | (6,219,753) |

## 3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දින නිකුත් කරන ලද 1/2021 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව රජයට අයත් ව්‍යවසායන් සඳහා හඳුන්වා දී ඇති මෙහෙයුම් අත්පොතේ 3 පරිච්ඡේදයේ 3.1 හා 3.2 (ii) ඡේදය ප්‍රකාරව මානව සම්පත් කළමණාකරණය සම්බන්ධයෙන් පූර්ණ බලතල අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා තිබුණි. 2022 මැයි 31 විගණන දිනය වන විටත් සමාගමේ බඳවා ගැනීමේ කාර්යය පටිපාටිය සකස්කර නොතිබුණි. | 2022 අප්‍රේල් 08 වන විට බඳවා ගැනීමේ ප්‍රතිපත්ති කෙටුම්පත සකස් කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. අවසන් වාර්තාව අනුමත කිරීමේ ක්‍රියාවලියේ පවතී. | බඳවා ගැනීමේ පටිපාටිය නිවැරදිව සකස් කර විධිමත් පරිදි අනුමත කරවාගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ)** සමාගමට අභ්‍යන්තර ජලනල එලීම සඳහා 2021 දෙසැම්බර් 20 දින රු.12,600,000 ක් භාණ්ඩාගාර අරමුදල් මගින් ජාතික ජල සැපයුම් මණ්ඩලයට ගෙවා තිබුණද අදාල සේවාවන් සැපයීම සම්පූර්ණ කර නොතිබුණි. | මෙම සේවා සපයන්නන් වැඩ ආරම්භ කිරීමට ගෙවිය යුතු මුළු මුදල ඉල්ලා සිටි බැවින්, වෙන් කරන ලද අයවැය තුළ ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයට ගෙවන ලදී. ජල සැපයුම ආයතන පිවිසුම ආසන්නයට ගෙන ඒමට අවශ්‍ය කටයුතු කර තිබුණි. SLIBTEC උද්‍යානය සැලසුම් කිරීමේ පිරිවැය ආයතනයේ අයවැය යටතේ කළ නොහැකි සැලකිය යුතු මුදලක් වූ බැවින්, USAID මගින් ප්‍රදානයක් ලබා ගැනීමට තීරණය කරන ලදී. ප්‍රදානය හරහා සැලසුම් නිම කිරීමට බලාපොරොත්තු වන බැවින් අභ්‍යන්තර ජල සැපයුම් ජාලය සම්පූර්ණ කළ නොහැක. | වියදම් දැරීමේදී උපරිම කාර්යක්ෂමතා වයෙන් හා ඵලදායීව සිදුකළ යුතුය. |
| **(ආ)** සමාගම් රසායනාගාරය පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනයෙන් ගොඩනැඟිල්ලක් බද්දට ගෙන 2021 සැප්තැම්බර් සිට 2022 අගෝස්තු මාසය දක්වා වන කාලයට රු.37,171,800 ක මුදලක් ගෙවා තිබුණි. ගොඩනැඟිල්ල සඳහා කුලී ගෙවා තිබුණ ද රසායනාගාරය පිහිටුවීමේ කටයුතු විගණන දිනය වන විටද සිදුකර නොතිබුණි. | සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදලක් මගින් සියළුම රසායනාගාර සැලසුම් කටයුතු අවසන් කර ඇති අතර රසායනාගාර උපකරණ මිලදී ගනිමින් පවතී. රටේ පවතින තත්ත්වය තුළ USD ගාස්තු ඉහළ යාම හේතුවෙන් ප්‍රමාදයක් සිදුවෙමින් පවතී. | රසායනාගාරය පිහිටුවීම කඩිනම් කළ යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ)** සමාගම මෙතෙක් පර්යේෂණ කාර්යයන් ආරම්භ කර නොතිබුණද, පර්යේෂණ සැලසුම් සකස් කිරීමේ කාර්යයට සහාය වීම සඳහා එක් අයකුට රු.200,000 ක මාසික වැටුප් හා දීමනා යටතේ විද්‍යාඥයින් 5 දෙනකු බඳවාගෙන ඇත. එමෙන්ම මූල්‍යමය ගනුදෙනු හා කාර්යයන් අවම වශයෙන් සිදුවන අවස්ථාවක මසකට රු.280,000 ක වැටුප් හා දීමනා ගෙවීමක් යටතේ මුදල් කළමණාකරුවකුද බඳවාගෙන තිබුණි. | ආයතනයේ ආරම්භක අවස්ථාවේ කටයුතු, වැදගත් සංවර්ධන සැලසුම්, පරීක්ෂණ වාර්තා සකස් කිරීමට හා උපාය මාර්ගික කටයුතු සිදුකිරීම සඳහා මනා දැනුමකින් යුතු වෘත්තිකයන් බඳවා ගැනීම සිදු කළ යුතුය. මෙම බඳවා ගැනීම 1/2021 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුකූලව සිදුව ඇති අතර වැටුප් තීරණය කිරීම පවතින රැකියා ඉල්ලුම, ව්‍යාපාරික නව ප්‍රවණතා මත පදනම්ව ආයතනයේ අපේක්ෂා හොඳින් ඉටු කර ගත හැකි ආකාරයෙන් සියළුම අනුමැතියන්ට යටත්ව සිදු කිරීමට පියවර ගෙන ඇත. | වියදම් දැරීමේදී උපරිම කාර්යසාධනය ක් ලබා ගැනීමට හැකි පරිදි කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| **(ආ)** 2021 පෙබරවාරි සිට මසකට රු.350,000 ක වැටුප් හා දීමනා ගෙවමින් 2021 අගෝස්තු මස අවසානය වන විට බයෝටෙක්නොලොජි උද්‍යානය ඇතිකිරීම හා පර්යේෂණ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කර ගැනීමේ කාර්යයට ව්‍යාපෘති කළමණාකරුවකුගේ සේවය ලබාගෙන ඇතත් 2022 මැයි විගණන දිනය වන විටත් එම කාර්යයන් ඉටුකර ගැනීමට ආයතනය අපොහොසත් වී තිබුණි. | ද්‍රව්‍ය හිඟය, වසංගත තත්ත්වය, ගමන් සීමා කිරීම්, හේතුවෙන් සියළු කටයුතු ප්‍රමාද විය. නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙතෙක් ඔප්පුව ලබා දී නොමැති අතර, මේ හේතුවෙන්, අභ්‍යන්තර ජල මාර්ග සහ විදුලි රැහැන් සමඟ ඉඩම මැනීම සැලසුම් කිරීම සහ අභ්‍යන්තර මාර්ග පද්ධතිය සැලසුම් කිරීම ඉදිරියට කරගෙන යාමට නොහැකි වී ඇත. මාර්ගය පුළුල් කිරීම සහ විදුලි රැහැන් ඉදි කිරීම තාවකාලිකව නතර කර ඇත. USAID රාජ්‍ය රෙගුලාසිවලට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන් එම වැඩ කටයුතුවල ප්‍රමාදයන් සිදු වී ඇත. එසේම ගොඩනැගිලි අයිතිකරු සතුව සැලසුම් නොතිබීම හේතුවෙන් සහ ඔවුන්ට ගෙවීමට ඇති මුදල රජය විසින් නොගෙවීම නිසා අප හට කාර්ය කිරීමට නොහැකි තත්ත්වයක පැවතුණි. | දරන සියළුම වියදම් ආර්ථිකභාවයෙන් විය යුතු අතර උපරිම කාර්යසාධනය ක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඇ)** පූර්ණ වශයෙන් භාණ්ඩාගාර අරමුදල් යොදවා සමාගම පවත්වාගෙන යනු ලැබුවත් සේවකයන් බඳවා ගැනීම හා වැටුප් තීරණය කිරීම භාණ්ඩාගාර පාලනයෙන් තොරව අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණය මත සිදුකිරීමට 1/ 2021 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය යටතේ නිකුත් කර ඇති මෙහෙයුම් අත් පොත ප්‍රකාරව ප්‍රතිපාදන සලසා දී තිබුණි. කිසිදු මෙහෙයුම් කටයුත්තක් ආරම්භ කර නොමැති මෙම සමාගමේ සේවකයන් සඳහා වැටුප් හා දීමනා ගෙවීමට 2020 ඔක්තෝබර් සිට 2021 දෙසැම්බර් දක්වා රු.20,247,521 ක් වියදම් දරා තිබුණු අතර එය ආයතනයේ මුළු පිරිවැයෙන් සියයට 40 ක් වී තිබුණි. | සමාගම කැබිනට් පත්‍රිකා අංක 20/1085/204/107 යටතේ රාජ්‍ය ව්‍යාපාර සංකල්පය යටතේ පිහිටුවන ලද ආයතනයක් වන අතර 2020.12.11 වන දින ගැසට් පත්‍රය මඟින් තාක්ෂණ අමාත්‍යාංශය යටතේ පිහිටු විය. මෙහිදී අදාල අරමුණු ඉටුකර ගැනීම සඳහා තරඟකාරී වෙළඳපොල තුල පවතින අරමුණු හා නව ප්‍රවණතා කෙරෙහි වැඩි අවධානය යොමු කළ යුතු බවත් ඒ සඳහා සුදුසු වන ලෙස ආයතන ව්‍යුහය සකස් කර ගත යුතු බවත් පැහැදිලිව සඳහන් වේ. ඒ අනුව එවැනි ආයතන කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව 1/2021 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව නිකුත් කර ඇති මෙහෙයුම් අත් පොත ප්‍රකාරව අප කටයුතු කර ඇත. | මෙහෙයුම් කටයුතු කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ඈ)** 2021 පෙබරවාරි 24 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි ප්‍රධාන විධායක නිලධාරිගේ මූලික වැටුප විශේෂ ව්‍යාපෘති දීමනාව, ප්‍රවාහන දීමනාව හා සන්නිවේදන දීමනාව යන දෑ ඇතුළත්ව රු. 250,000 ලෙස තීරණය කර අනුමැතිය ලබාදී තිබුණි. එසේ වුවත් ඒ ඒ දීමනාවන්ගේ වටිනාකම වෙන් වශයෙන් දක්වා නොතිබුණි. 2015 මැයි 25 දිනැති අංක 1/2015 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.3 ඡේදය ප්‍රකාරව නිල වාහනයක් හිමි | 2021 පෙබරවාරි 24 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ප්‍රධාන මෙහෙයුම් නිලධාරිනිය සඳහා මූලික වැටුප රු.250,000 කට යටත්ව විශේෂ ව්‍යාපෘති දීමනාව, ප්‍රවාහන දීමනාව සහ සන්නිවේදන දීමනාව ලබා දීමට සාකච්ඡා කළද ඉන් පසුව පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කරන ලද්දේ මාසික මූලික වැටුප රු.250,000 පමණක් ලබා දීමටය. එහිදී තවද ආයතනය සතු එකම මෝටර් රථය ප්‍රධාන මෙහෙයුම් නිලධාරිනිය යටතේ පවත්වා ගැනීමටත් ඒ සඳහා වැය වන ඉන්ධන වියදම් ආයතනය විසින් දැරීමට තීරණය කරන ලදී. දැනට ආයතනය සතුව ඇත්තේ එක මෝටර් රථයක් බැවින් අයතනයේ මෙහෙයුම් කටයුතු සිදුකිරීමේදී අවශ්‍ය | මෙහි සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය කිහිප වතාවක් ඉල්ලුම් කළද විගණනය සඳහා ඉදිරිපත් නොකරන ලදී. වියදම් දැරීමේදී නීති රීති රෙගුලාසි හා චක්‍රලේඛ |

| | | |
|---|---|---|
| නිලධාරියෙකුට එම නිළ වාහනය පාවිච්චි කිරීම හෝ නිළ වාහන වෙනුවට මාසික ප්‍රවාහන දීමනාවක් ගෙවීම යන විකල්ප දෙකෙන් එකක් තෝරා ගත යුතු වුවත්, 2021 පෙබරවාරි 24 දිනැතිව අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව සමාගමේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී හට රාජකාරී කටයුතු සඳහා රාජකාරියට යාමට හා ඒමට සමාගමට අයත් වාහනය භාවිතා කිරීමටත් ඊට අවශ්‍ය ඉන්ධන වියදම සමාගමෙන් ප්‍රතිපූරණය කිරීමටත් අවස්ථාව ලබා දී තිබුණි. නිලධාරියාගේ වැටුප තීරණය කිරීමේදීද, ප්‍රවාහන දීමනාව ඇතුළත් කර වැටුප තීරණය කර තිබීම හේතුවෙන් ඉහත 1/2015 චක්‍රලේඛයට පටහැනිව වාහනය හා ප්‍රවාහන දීමනාව යන දෙකම ලබා දෙන බව නිරීක්ෂණය විය. | වන රාජකාරී ගමන් කටයුතු සඳහාද බොහෝ විට යොදා ගනු ලබයි. එබැවින් මෙම මෝටර් රථය හුදු සමාගමේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරියාගේ රාජකාරී සඳහා පමණක් නොව පොදුවේ භාවිතා වන බවත්, කිසිදු ප්‍රවාහන දීමනාවක් හෝ ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණයක් සිදු වී නොමැත. | විධිවිධානවල ට අනුකූල විය යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ක්‍රියාකාරී සැලැස්ම ප්‍රධාන ක්‍රියාකාරකම් 09 ක් යටතේ දක්වා තිබුණු අතර ඉන් ක්‍රියාකාරකම් 02ක් සඳහා 2021 වර්ෂයේ දී ඉලක්කයන් ලබා දී නොතිබුණි. ඉතිරි ක්‍රියාකාරකම් 07 සඳහා කාර්ය සාධන දර්ශක (KPI) හෝ ඉලක්කයන් දක්වා නොතිබුණි. | විෂය පථ 06 ක් දැනට අවසන් කර ඇත. දැනට සංවර්ධනය කිරීමට නියමිත පළමු ක්ෂේත්‍ර 02 වන්නේ මානව සම්පත් පද්ධතිය සහ මානව සම්පත් ප්‍රතිපත්ති සංවර්ධනය සහ SLIBTEC නවෝත්පාදන උද්‍යානය සැලසුම් කිරීමයි. | තාත්ත්වික සැලසුම් සකස් කළ යුතු අතර, සැලසුම්ගත කාර්යයන් කාර්යක්ෂමව ඉටුකිරීම කළ යුතුය. |
| (ආ) ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් සඳහා ඇස්තමේන්තු ගත වාර්ෂික පිරිවැය දක්වා නොතිබුණි. | පිරිවැය සම්බන්ධ තොරතුරු 2021 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව තුල පැහැදිලිව දක්වා ඇත. | ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු ගත පිරිවැය දැක්විය යුතුය. |

| | | |
|---|---|---|
| **(ඇ)** ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය පිළිබඳ පරීක්ෂාවේදී 2021 දෙසැම්බර් 31 දින වන විට නිම කළ යුතු වූවත් නිම නොකළ ක්‍රියාකාරකම් නිරීක්ෂණය විය. | අවශ්‍ය වූ අතිරේක ප්‍රතිපාදන තවමත් ලැබී නොතිබීම, උද්‍යාන සැලසුම් කිරීම සඳහා වූ ද්‍රව්‍ය හිඟය, කොවිඩ් වසංගත තත්ත්වය, නාගරික සංවර්ධන අධිකාරිය විසින් උද්‍යානය සඳහා ඔප්පුව ලබා දී නොතිබීම, විද්‍යාගාර සඳහා උපකරණ ලබා ගැනීමට ප්‍රමාදවීම, රටේ පවතින ආර්ථික අර්බුධය වැනි කරුණු හේතුවෙන් ක්‍රියාකාරකම් ඉටු කිරීමට ප්‍රමාදවීම් ඇතිවිය. | තාත්ත්වික සැකසුම් සකස් කළ යුතු අතර, සැලසුම්ගත කාර්යයන් කාර්යක්ෂමව ඉටුකිරීම කළ යුතුය. |